# 17 කවි හදමු, රස විඳිමු

**සාහිත්‍ය නිර්මාණ අතර කවියට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. පෙර සිට ම කවිය ජනතාව අතර ප්‍රචලිත ව පැවැති බව අප අතර ඇති ජන කවිවලින් ද පැහැදිලි වේ. රසවත් වූ වැකිය කාව්‍යයයි. භාෂාව උගත් හැම දෙනා ම කවියෝ නොවෙති. හැම උගතෙක් ම කවියෙක් ද නොවේ. කවි ලිවීම සඳහා නිර්මාණාත්මක හැකියාව තිබිය යුතු ය. එසේ ම බොහෝ අත්දැකීම් ඇති අයකු ද විය යුතු ය. ඒ හැරුණු විට නිතර නිතර කවි ලිවීමෙන් පුහුණුවක් ලබා ගත යුතු ය.**

ඔබ තුළ ද කවි ලිවීමේ හැකියාව සැඟ වී තිබෙන්නට පුළුවන. නිතර නිතර කවි ලිවීමෙන් ඔබට ද එම හැකියාව දියුණු කර ගත හැකි වනු ඇත. කවියක් ලියන්නට සිතා පැනක් සහ කොළයක් ගෙන වාඩි වූ පමණින් ඔබට කවියක් ලිවීම අපහසු වනු ඇත. ලිවීමට පෙර ඔබේ සිතේ කවි සිතිවිල්ලක් (කාව්‍ය සංකල්පනාවක්) පහළ වී තිබිය යුතු ය. එබඳු අදහසක් ඔබ තුළ පහළ වන්නේ ඔබට ඇසෙන, පෙනෙන, දැනෙන දේ ඇසුරිනි. ඇසෙන, පෙනෙන, දැනෙන දේ ඇසුරින් ඔබ යම් සතුටක් ලබන්නේ නම් ඔබ ඒ ගැන නැවත නැවත සිහිපත් කරනු ඇත. ඒ ඇසුරින් ඔබ තුළ සුන්දර සිතිවිලි පහළ වනු ඇත. එයින් ඔබ ලබන සතුට තවත් බොහෝදෙනාට විඳ ගත හැකි වන පරිදි ඒ සිතිවිල්ල කවියක් බවට පත් කිරීමට ඔබට හැකි නම් ඔබ ද කවියෙකි. ඉහත කී කරුණු අනුව කවියක් ලියන්නට පෙර ලිවීමට සුදුසු දෙයක් ඔබ තුළ තිබිය යුතු බව වැටහෙනු ඇත.

වෙනත් ආකාරයකින් කියතොත් කවියක් ලිවීමට සුදුසු අත්දැකීමක් නැතහොත් තේමාවක් ඔබට තිබිය යුතු ය. ඔබ ජීවත් වන වටපිටාවෙන් ඔබට බොහෝ අත්දැකීම් ලබා ගත හැකි ය. ඔබේ පවුලේ සමීපතමයන් වන අම්මා, තාත්තා, නංගී, මල්ලී ගැන හෝ ඔබේ සුරතලුන් ගැන හෝ වටපිටාවේ ජීවත් වන සතුන් ගැන හෝ සොබා දහමේ සුන්දර වස්තූන් හා අවස්ථා ගැන හෝ ඔබට බොහෝ අත්දැකීම් ලබා ගත හැකි ය. කවියන් කිහිපදෙනෙකුගේ නිර්මාණ රස විඳිමින් මේ කාරණය පැහැදිලි කර ගැනීමට උත්සාහ කරමු.

ඩබ්. ඒ. අබේසිංහ කවියා **"අම්මා"** ගැන ලියූ කවියක්:

මහ මුහුදක් වැනි  අම්මා
මහ මිහිකත වැනි  අම්මා
හිරු මෙන් පායන  අම්මා
සඳ මෙන් බබළන  අම්මා

මුහුදක කිරි දුන් අම්මා
මිහිකත දුක් දරු අම්මා
රන් සමනොළ ගිර මුදුනේ
සිරිපා පද්මය අම්මා

මහ මුහුද, මහ පොළොව, හිරු, සඳු යන වස්තූන් යොද ගනිමින් අම්මාගේ අප්‍රමාණ ගුණ වර්ණනා කර ඇති ආකාරය බලන්න. ඔබේ අම්මා ගැන ඔබටත් මෙබඳු පුංචි කවියක් නිර්මාණය කිරීමට හැකිදැයි උත්සාහ කර බලන්න. ඉහත දැක්වූ කවිය ශබ්ද නගා කියවන්න. එම කවි කියවන විට ඔබේ සිතට හැඟෙන අදහස් මිතුරන් සමග සාකච්ඡා කරන්න. අම්මාගේ අගය මහ ඉහළින් ම වර්ණනා කර ඇති ආකාරය විමසන්න.

වලාකුළුවලින් තොර තාරකා විසිරී ගිය රෑ අහස කොතරම් සුන්දර ද ? ඇස්. මහින්ද හිමියන් එය දුටුවේ මෙසේ ය.

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

ඔබ ද රෑ අහස දැක ඇතිවාට සැකයක් නැත. එයින් ඔබ යම් සතුටක් ලබන්නට ඇත.

තරු පිරිවරාගත් සඳ පායා ඇති අහස ගැන ඩබ්. ඒ. අබේසිංහ කවියා මෙසේ කියයි.

නිල් පලසක් සේ
නිල් ආකා සේ
මල් පිපිලා සේ
නිල් ආකා සේ

මල් පිපිලා නෑ
නිල් ආකා සේ
තරු පායා ලා
නිල් ආකා සේ

තරු මල් විසිරුණු
මල් පියවිල්ලේ
සඳ මනමාලී
ලොවට වඩී වී

මුනිදස කුමාරතුංග කිවිඳුන් සඳපාන ගැන කියන සැටි බලන්න.

සඳ පානේ වැලි තලා
සුරකුමරියො මල් සලා
නටති මෙ දෙස බල බලා
ගිගිරි වළලු පය නොලා

කොතෙකුත් මෙබඳු අත්දැකීම් මුල් කර ගෙන කවි නිර්මාණය කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඉතාමත් සරල දේවල් මාතෘකා කර ගෙන රසවත් කවි නිර්මාණය කළ හැකි බව පහත දැක්වෙන කවි කියවීමෙන් අවබෝධ කර ගන්න.

මගේ පොත
වගේ මට
අගේ ඇති
දෙයක් නැත

පිට කවරේ
පින්තූ රේ
ඇති ලස්සන
මේ බලන්න

මගේ පොතේ
අකුරු ලොකුයි
ඔබේ පොතෙත්
ඒ වගේ ද?

ඇස්. මහින්ද හිමි.

## වැස්ස

සිරි සිරි ගා
පොද වැටෙන්න
බිම ටික ටික
තෙමී යන්නෙ

දූවිලි කෝ
යට වෙලාය
උණුසුම කෝ
ඇල් වෙලා ය

හෝ හෝ දැන්
මහ වැස්සක්
ගලා යා ය
හැම අස්සක්

ඇස්. මහින්ද හිමි

වැස්ස ගැන ඩබ්. ඒ. අබේසිංහ කවියා කියන ආකාරය බලන්න.

වලාකුළේ රන් පාටට
විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින්
අකුණු හඬනවා
බිංදු බිංදු මහ පොළොවට
වතුර වැටෙනවා
හෝ ගාමින් අපේ ගමට
වැස්සක් එනවා

අවුරුදු කාලය මාතෘකා කර ගෙන ඩබ්. ඒ. අබේසිංහ කවියා ලියා ඇති පහත දැක්වෙන කවි ද කියවන්න.

අඹ රඹුටන් ජම්බු ඉදෙන - අවුරුදු කාලේ
ජමනාරං දොඩම් ඉදෙන - අවුරුදු කාලේ

දෙඹ ගස් යට මල් පිපිලා - අවුරුදු කාලේ
අපේ ගමට ඔන්න ඇවිත් - අවුරුදු කාලේ

කජු පුහුලන් පැණි බේරෙන - අවුරුදු කාලේ
එරබදු මල් රතට පිපෙන - අවුරුදු කාලේ

කෝකිල ගී සිංදු ඇහෙන - අවුරුදු කාලේ
අපේ ගමට ඔන්න ඇවිත් - අවුරුදු කාලේ

ඉහත දැක්වුණු කවි කිය වූ ඔබට කාව්‍ය නිර්මාණ සඳහා විවිධ අත්දැකීම් මුල් කර ගත හැකි බව වැටහෙන්නට ඇත. ඔබේ අත්දැකීම් අලුත් ආකාරයකට නිර්මාණාත්මක ව කවියට නැඟීමට උත්සාහ කරන්න.

කාව්‍ය නිර්මාණයක් සඳහා සුදුසු අත්දැකීමක් තෝරා ගත් ඔබට එය ඉදිරිපත් කිරීමට සුදුසු ආකෘතියක් නැතහොත් සැලැස්මක් ද තිබිය යුතු ය. කවිය කිසියම් තාලයකට අනුව ගායනා කළ හැකි විය යුතු ය. තාලයකට අනුව ගායනා කිරීමට හැකි වන අයුරින් වචන සංවිධානය කළ යුතු ය. පහත දැක්වෙන කවිය ශබ්ද නගා කියවන්න.

දත් කැකුළු පාලා
සුරතල් සිනා සීලා
බොළඳ බස් දීලා
කෙළී සියොළඟ දූලි ගාලා

මේ කවිය පහසුවෙන් තාලයකට අනුව ගායනා කළ හැකි වන්නේ එහි කිසියම් සැලැස්මකට අනුව පද සංවිධානය කොට ඇති බැවිනි. පහත දැක්වෙන කවිය ද කියවන්න.

පෙරදිග ලෝකයේ බබළන මුතු ඇට ය
පණ ඇති මහා සමුදුර පවුරෙන් වට ය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ රට ය
ලොව අන් සියලු දිවයින් මේකට යට ය

මුලින් කී කවියට වඩා මෙහි පද සංවිධානය වෙනස් ය. ගායනා කළ යුතු තාලය ද වෙනස් ය. ඒ වෙනස් ආකෘතියකි. ඉහත කවි දෙක විරිත් දෙකකට අයත් වෙයි.

"මහමුහුදක් වැනි අම්මා
"නිල් පලසක් සේ
නිල් ආකාසේ "
"සඳපානේ වැලිතලා "
"මගේ පොත"
"වලාකුළේ රන් පාටට"

යන මුලින් ඔබ කිය වූ කවි නැවත ශබ්ද නගා කියවමින් ඒවායේ ආකෘතියෙහි ඇති වෙනස්කම් හඳුනා ගන්න. එසේ තාලයකට කියවිය හැකි සැලැස්මකට අනුව ඔබේ කාව්‍ය නිර්මාණය කරන්න.

රසවත් වූ වැකිය කවිය බව මුලින් කීවෙමු. ඔබේ කවිය ද රසවත් එකක් විය යුතු ය. කවියක අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද තිබීම වැදගත් වේ. ඔබේ කවිය හුදු වාර්තාවක් නොවිය යුතු ය. උපමා, රූපක ආදී කාව්‍ය අලංකාර මගින් අර්ථය රසවත් ලෙස ඉස්මතු කිරීමට පෙලඹිය යුතුය.

"මහ මුහුදක් වැනි"
"මහ මිහිකත වැනි"
"පායන හිරු මෙන්"
"සඳ මෙන්"

අම්මා ගැන කියන්නට යොදා ගෙන තිබෙන **උපමා** දෙස බලන්න. අම්මාගේ අගය ඉතා ඉහළින් කියන්නට මේ උපමා හේතු වී ඇති ආකාරය විමසන්න.

"සිරිපා පද්මය අම්මා" මේ **රූපකයකි**. මෙහි "සිරිපා පද්මය මෙන්" නොකියා අම්මා සිරිපා පද්මය ම බව කියයි.

කවියේ ශබ්ද රසය ඇති කිරීමට අනුප්‍රාසය යොදා ගැනේ. අනුප්‍රාසය යනු සමාන අකුරු සහිත සමාන පද ළඟ ළඟ යෙදීමෙන් ඇති වන නින්නාදයයි.

"පෙරළි පෙරළි රළ ඇවිදින් - වෙරළෙළ හැපෙනවා"

මෙහි 'ර' සහ 'ළ' අකුරු සහිත පද ළඟ ළඟ යෙදීම නිසා කනට ප්‍රිය ශබ්ද රටාවක් උපදියි.

සඟ සිරි අසා ලා
කළ' යුරු සොඳුරු සා ලා
සිරින් සුවිසා ලා
පවර නුවරෙක් වී විසා ලා

මේ කවියෙහි 'ස' සහ 'ර' අකුරු ළඟ ළඟ නිතර යෙදීම නිසා ශබ්ද රසය ඉස්මතු වන ආකාරය බලන්න. එසේ ම කවියේ පාද සතරේ ම අග යෙදී ඇති 'ලා' යන්නෙන් කවියට ලැබී ඇති ආලෝකය ද විමසන්න. එසේ කවියක පාද සතරේ ම අග අකුර

සමාන ව යෙදීම "එළිවැට" නමින් හැඳින්වේ. ඔබට ද එළිවැට සහිත ව කවි නිර්මාණය කිරීමට හැකි දැ යි බලන්න.

කවියක් නිර්මාණය කිරීමේ දී අවශ්‍ය වන තවත් වැදගත් කාරණයක් නම් සුදුසු පදමාලාවක් යොදා ගැනීමයි. ඔබේ අත්දැකීම ප්‍රකාශ කිරීමට වඩාත් සුදුසු වචන මාලාවක් යොදා ගැනීමෙන් කවිය රසවත් එකක් බවට පත් වෙයි.

" හා හා හරි      හාවා
කැලේ මැදින්      ආවා
හිට ගෙන ගඟ      ගාවා
වට පිට ඇහැ      ලෑවා"

හාවෙකුගේ ඉරියව් ගැන කියන්නට යොදා ගෙන ඇති මේ පද මාලාව කොතරම් සුදුසුදැයි බලන්න. තැනට සුදුසු ලෙස බස යොදා ගැනීමට හැකියාවක් ඔබට තිබිය යුතු ය. කාව්‍ය නිර්මාණයෙහි යෙදීමෙන් ඔබට ඔබේ භාෂා කුසලතාව දියුණු කර ගැනීමට හැකි වෙයි.



## ක්‍රියාකාරකම 1

- "කවි හදමු -රස විඳිමු" තේමාව යටතේ ඔබ ඉගෙන ගත් කාව්‍යමය යෙදුම් උදව් කර ගනිමින් පන්තියේ සියලුදෙනා ම තම තමන් කැමති මාතෘකාවක් යටතේ කවි පන්තිය බැගින් ලියා බිත්ති පුවත් පතක් නිර්මාණය කරන්න.



## ක්‍රියාකාරකම 2

වරහන තුළ දී ඇති වචන අතරින් හිස්තැන් පිරවීමට වඩාත් සුදුසු වචන යොදමින් කවිය සම්පූර්ණ කරන්න.

i. (රොන්, බමරු, කුසුම්, අතු, සිත, මල්, ගස්, අපි)

බෝවිටියා ---------------------------- පිපිලා
පෙති අතරේ--------------------------- පිරිලා
බරට බරේ --------------------------- සැදිලා
බුදු පුදයට --------------------------- සැදිලා

ii. (ගමේ, පය, අතට, වෙලේ, කුඹුරට, කට, කරට, ගෙදරට)

පහළ ------------------------------- ගොවිරාලත්
ඇඟ පත ------------ ----------- සෝදලා
උදලු කෙටිය අරන් ---------------------------
හනික හනිකට යයි .......................

iii. (හැකිලෙන, පියඹන, නැළවෙන, විසිරෙන, නලියන, ඔරවන, දඟලන, හිනැහෙන)

සුළඟින් සැලී -------------- මල් පෙති රැන යි

වැල බැඳ එකට ------------ සමනල බාන යි

සලමින් වලග අතු අග ---------------ලේන යි

කලබල කරන කල -------------------බකමූණ යි



## ක්‍රියාකාරකම 3

කවිය සම්පූර්ණ කොට ලියන්න.

i. හිමිදිරියේ අවදි වෙලා
දත් මැදලා මුව දෙවලා
----------------------------------------
----------------------------------------

ii. තරු හිනැහෙන නිල් අහසේ
රන් තැටියක් සේ බබළන
----------------------------------------
----------------------------------------



## රස විඳිමු

ඕලු නෙළුම් නෙරිය රඟා ලා
කිකිණි හඬන වලා නගා ලා
ගඟුල් තොටිල්ලේ - මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල් ගා

යමු නැළැවිල්ලේ - නැළැවිල්ලේ - නැළැවිල්ලේ
ඇදී ඇදී යන්නැ නදී රිදී තොටිල්ලේ